**මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 ට - 2022**

---

**1. විගණන මතය**

**1.1** මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2022 වර්ෂයට අදාලව මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර, එම වාර්තාවල කාරක සභා 17 විසින්ම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. මතය සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 17 ක ඉඩම්, කාර්යාල ගොඩනැගිලි, පොහොර ගබඩාව සහ අලෙවි මධ්‍යස්ථානයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරාගෙන සියලු මූල්‍ය නොවන වත්කම්වල තක්සේරු සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | අයිත්තියමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ පරිගණක 03ක්, තණකොළ කපන යන්ත්‍ර 04ක්, විෂබීජ හරණ ආලේපන යන්ත්‍ර 03ක්, වී වගා කිරීමේ යන්ත්‍ර 04ක්, වල්නාශක යන්ත්‍ර 04ක්, ගොයම් පාගන යන්ත්‍ර 01ක්, කව්පිවල ආවරණය ඉවත් කිරීමේ යන්ත්‍ර 01 ක්, ඩෝසර් යන්ත්‍ර 01ක් සහ ඡායා පිටපත් යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර සූත්‍රවලට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම් නිරූපණය කිරීමට කටයුතු කරනු ලැබේ. | දේපල, පිරියත හා උපකරණවල වටිනාකම් නිරූපණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අයිත්තියමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ රෝද දෙකේ ට්‍රැක්ටර් විකිණීමෙන් වූ රු.642,134ක ණයගැති ශේෂය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර නොතිබුණි. | රෝද දෙකේ ට්‍රැක්ටර් සඳහා වාරික ගෙවීම අය කර කොමසාරිස් වෙත යවනු ලබන අතර, ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ පරිගණක 01, කොළ කපන යන්ත්‍ර 01, තණකොළ කපන යන්ත්‍ර 11, | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඡායා පිටපත් යන්ත්‍ර 01, විෂබීජහරණ ආලේපන යන්ත්‍ර 04, රසායනික ද්‍රව්‍ය ඉසින යන්ත්‍ර 03, විදුලි ඉසින යන්ත්‍ර 32, පරිගණක තිර 02, බල ජෙනරේටර් 02, මාලිමා 01, වයිෆයි රවුටර් 01, ආරක්ෂිත අගුළු 01, අගුළු 01 සහ ගොවිජන බැංකු කවුළු 01 මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර නොතිබුණි. | | |
| (ඉ) | මන්දපත්තඩි ගොවිජන සේවා කාරක සභාවේ රු.637,175 ක් වූ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් වර්ෂය සඳහා ලාභය හා ලැබිය යුතු වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්වා ඇත. | ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | කොක්කාඩ්ඩිච්චෝලෙයි ගොවිජනසේවා කාරක සභාවට සමාලෝචිත වර්ෂය තුළ විවිධ වර්ග 05 කට අයත් උපකරණ 27 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත. කෙසේ වෙතත්, එම කාලසීමාව සඳහා මෙම උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වටිනාකම තීරණය කර එය ඉදිරියේදී ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 02 ක 2016 වර්ෂයේදී පිරිවැය රු.589,955 කට නිම කරන ලද හරිතාගාර, ලෝහ කුඩාරම් සහ ඉදිකිරීම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඌ) | 2008 සිවිල් යුද්ධයෙන් රුපියල් 459,562 ක මුළු වටිනාකමකින් යුත් වත්කම් 66 ක් හානියට පත් වූ අතර, මේ සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ද ලියාපදිංචි කරන ලදී. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 103 සහ 104 ප්‍රකාරව එම වත්කම් කපා හැරීමට කටයුතු කර නොතිබූ අතර දීර්ඝ කාලයක් තිස්සේ ඒවා මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර තිබුණි. | කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | කුරින්වන්කර්නි ගොවිජන සේවා කාරක සභාව වෙත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් කාර්යාලය විසින් ලබා දෙන ලද රු.3,067,900ක් වටිනා තත්ත්ව පාලන රසායනාගාර උපකරණ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ 18,160kg ක නොමිලේ ලබා දෙන කාබනික පොහොරවල වටිනාකම හා 4,472 ක දියර පොහොර තොග ගිණුමට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදී තොග ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | අයිතමය | මූල්‍ය ප්‍රකාශන වටිනාකම අනුව | උපලේඛනය අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | ------- | ----------- | -------- | ---------- | ----------------- | ------------------------ |
| | | (රු.) | (රු..) | (රු..) | | |
| (අ) | ලැබිය යුතු විකුණුම් | 310,550 | 385,000 | 74,450 | ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශිෂ්‍යත්ව අරමුදල් | 75,367 | 264,691 | 189,324 | ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු වටිනාකම් පෙන්වා ඇත. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | කළමනාකකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------- | -------------- |
| (අ) | කාත්තන්කුඩි ගොවිජන සේවා කාරක සභාවේ නිසි අනුමැතියකින් තොරව, එකතු කරන ලද මූල්‍ය බදු කුලිය සහ වාර්ෂික ආදායම මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. ඒ අනුව එම ආදායම සභාවේ වියදම් කිරීමට යොදාගෙන තිබුණි. තවද, ගොවිජන සංවර්ධන නිලධාරියා විසින් අවස්ථා 6කදී ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමක රුපියල් ලක්ෂ 15ක මුදලක් තැන්පත් කරන තිබුණි. මුදල් තැන්පත් කළ දින සිට ස්ථාවර තැන්පතු මත පොලිය ජංගම ගිණුමට මාරු කර තිබුණු අතර එය කාරක සභාවේ වියදම් සඳහා භාවිතා කර ඇත. | මෙම අරමුදල රජයේ ඉඩම් ආඥාපනත ප්‍රකාරව භාවිත කිරීමට කටයුතු කරනු ලැබේ. | රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව මෙම අරමුදල් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම් ආඥාපනතේ විධිවිධාන අනුව පලුකාමම් ගොවිජන සේවා කාරක සභාවට පවරා නොදුන් හෙක්ටයාර 0.6514ක රජයේ ඉඩම, ඉඩම් | සහකාර කොමසාරිස්ගේ අනුමැතිය සහිතව ඉඩම ලබා දී ඇත. | රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව මෙම අරමුදල් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

ආඥාපනතට පටහැනිව වසර 30ක බදු ගිවිසුමක් යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයා විසින් පුද්ගලයන් 02 දෙනෙකුට ලබාදී තිබුණි.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 ක 2008 සිට 2010 දක්වා කාලය තුළ ජපන් ජෙන් ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති රෝද දෙකේ ට්‍රැක්ටර් සහ උපකරණ සඳහා හිඟ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොමැති අතර ඒවා නැවත සභාවට පවරාගෙන නොමැත. | වටිනාකම් නැවත අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක 2010 වසරේ තිරසාර සංවර්ධන කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ වාරික පදනම සඳහා ගොවීන්ට සූර්යබල ජල පොම්ප ලබා දීම වෙනුවෙන් ගොවියන්ගෙන් අයවිය යුතු රු.17,357,979 ක මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම් නැවත අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ රු.703,094 ක් වූ ණයගැති ශේෂයන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | මන්දූර් ගොවිජන සේවා කාරක සභාවේ 2018 වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී පොහොර හා රසායනික ද්‍රව්‍ය ණයට විකුණුම් සඳහා වූ රු.1,764,795 ක ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම

| | අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකරන ලද විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | දේපල, පිරියත හා උපකරණ | 10,148,427 | ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ලැබිය යුතු | 3,881,931 | ණයගැති උපලේඛන, ලයිස්තු, සනාථ කිරීමේ ලිපි සහ විශ්ලේෂණ වාර්තා | ණයගැති උපලේඛන, ලයිස්තු, සනාථ කිරීමේ ලිපි සහ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ණයගැති උපලේඛන, ලයිස්තු, සනාථ කිරීමේ ලිපි සහ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ජංගම වගකීම් | 4,785,304 | අදාල ලේඛන හා ණයහිමි ලැයිස්තුව, | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ලේඛන, ණයහිමි ලැයිස්තුව නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br><br>**මුදල් රෙගුලාසි** | | | |
| (i) | 110 | ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් තොග හා පාඩු ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී තොග හා පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | තොග හා පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ii) | 262(ii) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ගෙවීම් වවුචර් හා වෙනත් ආනුශාංගික ලේඛනවල "ගෙව්වා" මුද්‍රාව තබා නොතිබුණි. | ගෙවීම් වවුචර් හා වෙනත් ආනුශාංගික ලේඛනවල "ගෙව්වා" මුද්‍රාව තැබීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | 454(2) | ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් විද්‍යුත් උපකරණ ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | විද්‍යුත් උපකරණ සඳහා ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (iv) | 880 | ගොවිජන සේවා කාරක සභා 17 ක මුදල් ගනුදෙනු කරන නිලධාරීන්ගෙන් ආරක්ෂිත තැන්පතු ලබාගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) | 44(1) වගන්තිය | සෑම ගොවි සංවිධානයකම ගිණුම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු විසින් විගණනය කළ යුතුය. නමුත් ගොවිජන සේවා කාරක සභා 17 ක ගොවි සංවිධානවල ගිණුම් විගණනය කර නොතිබුණි. | ගොවි සංවිධානවල ගිණුම් විගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | නීතිමය ප්‍රතිපාදන අනුව, ගොවි සංවිධානවල ගිණුම් විගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 53 (1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 17 ක කුඹුරු ඉඩම් ලේඛනය (PLR) වසර තුනකට වරක් සමාලෝචන කාලයකින් පසු ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් සහතික කර නොතිබුණි. | කුඹුරු ඉඩම් ලේඛනය (PLR) වසර තුනකට වරක් සමාලෝචන කාලයකින් පසු ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් සහතික කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නීතිමය ප්‍රතිපාදන අනුව, කුඹුරු ඉඩම් ලේඛනය (PLR) සමලෝචනය කර සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා කාරක සභා 17 ක මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,768,326 ක අතිරික්තයක් විය. ඊට අනුරූපීව, පෙර වර්ෂයේ අතිරික්තය රු.8,393,661 ක් විය. ඒ අනුව, මූලය කාර්යසාධනයේ වැඩිවීම රු.373,665 කි. අක්කර බදු ආදායම වැඩිවීම, පොහොර විකුණුම් ආදායම වැඩිවීම සහ ස්ථාවර තැන්පතු මත පොලී ආදායම වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සංවර්ධන බැංකු 17 හි මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,136,839 ක අතිරික්තයක් විය. ඊට අනුරූපීව පෙර වර්ෂයේ අතිරික්තය රු.3,309,447 ක් විය. ඒ අනුව මූල්‍ය කාර්ය සාධනය රු.172,607 කින් අඩු වී ඇති අතර, බැංකුවල ණය පොලී අනුපාතය සියයට 7 කින් අඩුවීම ඒ සඳහා හේතුවී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| | ----------------------- | -------------------- | ------------- |
| (අ) | වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු. මිලියන 2 ක් පොහොර ගිණුමට මාරු කර ඇත. එම මුදල පොහොර මිලදී ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු ගොවිජන සංවර්ධන සහා ගිණුමට නැවත එවිය යුතු වුවත් ආපසු එවා නොතිබුණි. | බෙදා හැරීමේ කාලය තුළදී විධිමත් ආකාරයට කටයුතු කරනු ලැබේ. | එම මුදල ගොවිජන සංවර්ධන සහා ගිණුමට ආපසු එවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ 2019 වර්ෂය තුළදී 2016/2017 වර්ෂවල මහ කන්නයේ ඉතිරි පොහොර විකිණීමෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල්ගේ නමට රු.මිලියන 1.3 ක් වටිනා චෙක්පතක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, විගණිත දිනය වනවිටත් එම චෙක්පත නිෂ්කාශනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි කටයුතු කරනු ලැබේ. | චෙක්පත නිෂ්කාශණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දීර්ඝ කාලයක සිට ගිණුම්වල නිරූපණය කර ඇති ණයහිමි ශේෂ 17 කට අදාල රු.1,702,001 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කිරීමට හෝ කපා හැරීමට කොක්කාඩ්ඩිච්චෝලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඈ) | වාලච්චේන ගොවිජන සේවා කාරක සභාවේ 2021/2022 මහ කන්නයේ වගාව සඳහා යොදවා ගැනීමෙන් පසු ඉතිරි යූරියා පොහොර රු.2,244,021 ක මුදලකට බඩ ඉරිඟු වගාව සඳහා ගොවීන් වෙත විකුණා තිබුණි. නමුත්, මෙම මුදල පොහොර ලේකම් කාර්යාලය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | කොමසාරිස්වරයාගෙන් උපදෙස් නොලැබීම හේතුවෙන් එම මුදල පොහොර ලේකම් කාර්යාලය වෙත යවා නොමැත. | ගෙවිය යුතු මුදල් නියමිත වේලාවට නිරවුල් කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 02 ක රු.475,715 ක පිරිවැයකට මිලදී ගෙන තිබූ රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වී තිබූ අතර, ඒවා විනාශ කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒවා විනාශ කිරීමට දිස්ත්‍රික් කොමසාරිස් වෙතින් අනුමැතිය ඉල්ලා ඇත. | මුදල් රෙගුලාසි 102 සිට 109 අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 වසරේ ඇති වූ අසාමාන්‍ය තත්ත්වය හේතුවෙන් තන්තමලෙයි ගොවිජන සේවා කාරක සභාව සතු රු.2,086,912 ක් වටිනා වත්කම් අහිමි වූ අතර, ඒ සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ද ගොනු කර තිබුණි. නමුත්, වසර 14 ක් ගත වී තිබුණද, මෙය නිරවුල් කිරීමට වැඩිදුර කටයුතු සිදු කර නොතිබුණි. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 102 සිට 110 අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේදී කරදියනාරු ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රු.446,151 ක වත්කම් විනාශ වූ බවට වාර්තා කර තිබුණද, සමාලෝචිත | එය කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | එය කපා හැරීමට කටයුතු කළ යුතුය. |

වර්ෂය අවසන් වන විටත් එය කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ---------------- |
| (අ) | විගණිත දිනය වන 2023 මැයි 11 දින වන විටත් වාකරෙයි හා පළුකාමම් ගොවිජන සේවා කාරක සභා දෙක විසින් සභාව පිහිටි ඉඩමේ අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කරනු ලැබේ. | ඉඩම් අයිතිය ලබා ගැනීමට විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53(1) වගන්තිය අනුව, පලුකාමම් ගොවිජන සේවා කාරක සභාවේ 2020 වසරේ සිදු කරන ලද සමාලෝචනයේදී ගොවීන් 6,925 කට අයත් කුඹුරු අක්කර 2,972 ක් පමණක් කුඹුරු ඉඩම් ලේඛනයේ ලියාපදිංචි කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාදුන් ඉඩම් සඳහා හිමිකම් ලේඛන ලබාගෙන නොතිබුණු නිසා හිමිකම් ලේඛන නොමැති ඉඩම් ලියාපදිංචි කර නොමැත. | පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කිරාන් ගොවිජන සේවා කාරක සභාවේ ග්‍රාම නිලධාරී වසම් 13 ක කුඹුරු අක්කර 24,404 ක් ඇත. එයින් කුඹුරු ඉඩම් ලේඛනයේ ලියාපදිංචි කර ඇත්තේ ඉඩම් අක්කර 8,516ක් පමණක් වන අතර, ඉතිරි කුඹුරු ලියාපදිංචි කිරීමට කටයුතු කර නොමැත. | හිමිකම් ලේඛන ලබාදුන් පසු ඉතිරි කුඹුරු ඉඩම් ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ. | කුඹුරු ඉඩම් ලියාපදිංචි කිරීමට විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉඩම් ආඥාපනතේ රෙගුලාසිවල 224(1) වගන්තියට අනුව රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවකට රජයේ ඉඩම් ලබාදීමට පෙර දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වෙතත්, ගොවිජන සේවා කාරක සභා 1975 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අතර, වසර 40ක සිට සහා 17 ක ඉඩම් පිළිබඳ නීත්‍යානුකූල අයිතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොතිබුණි. | කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සනින් යුත් ලිපිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවා ඇත. | ඉඩම් අයිතිය පිළිබඳ නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53(1) වගන්තියට අනුව 2020 වසරේ සිදු කරන ලද සමාලෝචනයේදී තන්තමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ ගොවීන් 10,689කට අයත් කුඹුරු අක්කර 3,040ක් ලේඛන ගැටලු හේතුවෙන් කුඹුරු ඉඩම් ලේඛනයේ ලියාපදිංචි කර නොතිබුණි. | කුඹුරු ඉඩම් ලියාපදිංචි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගොවීන්ගේ කුඹුරු ඉඩම් ලියාපදංචි කිරීමට විධිමත් පියවර ගත යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අයිත්තියමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ 2022 යල කන්නයේ දී හෙක්ටයාර 2,623.1 කට දින 50 ට අඩු සහ වැඩි වී වගාවන් සඳහා යූරියා පොහොර ඉල්ලා ඇත. ඒ අනුව, වටිනාකම රු.3,463,965 ක් වූ යූරියා මෙට්‍රික් ටොන් 142.55 ක් දින 30ක ප්‍රමාදයකින් ලැබී තිබුණි. මේ ප්‍රමාදය නිසා ගොවීන්ට නියමිත වේලාවට පොහොර ලබාදීමට නොහැකි වී තිබුණි. තවද, එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.2,857,680 ක් වටිනා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 117.6 ක් වැඩිපුර ලැබී තිබුණි. | මඩකලපුව දිස්ත්‍රික්කයේ වී වගාව අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා කලින් ආරම්භ කරන අතර පොහොර ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් එය ගොවීන්ට ලබාදීමට ප්‍රමාද වී ඇත. | නියමිත වේලාවට ගොවීන්ට පොහොර ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය වසර 5 ක ලියාපදිංචි කිරීම්වලට අනුව කුඹුරු ඉඩම් ලේඛනයේ ලියාපදිංචි වී ඇති මුළු ප්‍රමාණය අක්කර 23,610 කි. නමුත් අක්කර 17,454.25 ක පමණක් වී වගාව සිදු කර ඇති අතර, එම ප්‍රමාණයට පොහොර නිකුත් කර තිබුණි. මේ නිසා කුඹුරු අක්කර 6,155.75ක් කුඹුරු වගාව සඳහා යොදා නොගත් නමුත්, වගා නොකළ කුඹුරු පිළිබඳ ලේඛනය සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | දත්ත පවත්වාගෙන යාමට විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොක්කාඩිච්චෝලෙයි ගොවිජන සේවා කාරක සභාවේ 2021/2022 මහ කන්නයේ දී ජෛව දියර පොහොර ලීටර් 1,451ක් ගොවීන් වෙත ලබා දුන් බවත්, 2022 යල කන්නයේ දී ජෛව දියර පොහොර ලීටර් 182ක් ලබා දුන් බවත් වාර්තා වී තිබුණි. කෙසේ නමුත්, එම පොහොර භාවිතා කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන නිලධාරියා විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ වී වගාව අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා කලින් ආරම්භ වන අතර පොහොර ලැබීම ප්‍රමාදය හේතුවෙන් ගොවීන්ට බෙදා දීමට ප්‍රමාද විය. | සහනාධාර පොහොර අදාළ වගා කන්නයේ ගොවීන් වෙත ලබාදීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | එරාවූර් ගොවිජන සේවා කාරක සභාවේ 2022/2023 මහ කන්නයේ විකුණුම් මුදල නියමිත වේලාවට අදාළ දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වගකීම් ලෙස රු.22,961,560 ක් නිරූපණය විය. | ඉදිරියේදී අවශය කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ප්‍රමාදයකින් තොරව පොහොර විකුණුම් මුදල් යැවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අස්වැන්නෙන් පසු ණය කඩිනමින් පියවිය යුතුය යන කොන්දේසිය යටතේ ගොවීන් 96 දෙනෙකුට ලබාදුන් කෘෂි රසායන ණය, යූරියා ණය සහ ජෛව දියර පොහොර ණයවල රු.3,363,924 ක හිඟ ණය මුදල් අයකර ගැනීමට කිරාන් ගොවිජන සේවා කාරක සබාව විසින් කටයුතු කර නොතිබුණි. මීට අමතරව, එම ණය සඳහා ණය ලෙජරය ද නඩත්තු කර නොතිබුණි. | එම ණය සඳහා ණය ලෙජරය පවත්වාගෙන ගොස් තිබූ අතර ඉදිරියේදී එම ණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ඉඩම් ආඥාපනතේ 224(7) වගන්තියට අනුව රජයේ දෙපාර්තමේන්තු වෙත කිසියම් කටයුත්තක් සඳහා ලබා දී ඇති රජයේ ඉඩම්, ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව අපේක්ෂිත කාර්යයෙන් පරිබාහිර කාර්යයන් සඳහා යොදා නොගත යුතුය. කෙසේ වෙතත්, කාත්තන්කුඩි ගොවිජන සේවා කාරක සභාවේ 2002 වසරේ සිට කෘෂිකර්මාන්තය හැර වෙනත් වාණිජ කටයුතු සඳහා භාවිතා කරන පුද්ගලයින් හතර දෙනෙකුට ඉඩම් බදු දී ඇති අතර, ගොවිජන සංවර්ධන නිලධාරියා විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අනාගතයේදී මෙවැනි වැරදි සිදු නොවනු ඇත | ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| දිළිඳු ගොවීන්ගේ සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා ගොවි සංවිධානයේ සාමාජික නියෝජිතයන්ගෙන් ලැබුණු මුදල් ගොවිජන සේවා කාරක සභා 4 ක් විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළද. එම මුදලින් හෝ එහි පොලියෙන් දීර්ඝ කාලයක් තුළ ශිෂ්‍යත්ව ලබා දී නොතිබුණි..එහි ප්‍රතිඵලයක් ලෙස රු.2,014,948 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කර නොතිබුණි. | අරමුදල් උපයෝජනය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | අරමුදල් උපයෝජනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 4 ක් වෙත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කැබලි කිරීමේ යන්ත්‍ර ලබා දී තිබුණි. එහෙත් ඒවා අපේක්ෂිත කාර්යයට යොදා ගැනීමට හෝ ගොවීන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එය අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර නිෂ්ක්‍රීයව පවතී. | ගරු ආණ්ඩුකාරවරයා වෙත නැවත යැවීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 වසරේ ගොවිජන සේවා කාරක සභා 05 ක් වෙත ලබා දුන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.1,498,000 ක වියදමින් හරිතාගාර ඉදි කර තිබුණි. කෙසේ වෙතත්, එහි කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ නොකර අක්‍රියව පැවතුණු අතර, නිෂ්පාදන වැඩිදියුණු | මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම සහ අරමුණ ඉටු වී නොතිබුණි. | හරිතාගාර නිෂ්පාදන වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ කටයුතු සඳහා මෙම හරිතාගාර භාවිතා කිරීමට සභාවන් අපොහොසත් වී තිබුණි. | | |
| (ඇ) | මන්දාපත්තඩි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.2,895,000ක පොහොර මිල දී ගෙන ඇති අතර, රු.2,875,700ක් වටිනා පොහොර ගබඩාවේ ඉතිරිව තිබුණි. එය මුළු මිලදී ගැනීම්වලින් සියයට 99ක් නියෝජනය කරයි. | නැවත මිලදී ගැනීම සම්බන්ධව සභාව දැනුවත් නැත. | එම පොහොර අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මන්දාපත්තඩි ගොවිජන සේවා කාරක සභාව සතු ඩෝසරය 2013 වසරේ සිට අළුත්වැඩියා කළ යුතුව පවතින අතර, එතැන් සිට කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. තවද, 2013 සිට 2018 දක්වා රු.6,000,000 ක ක්ෂයවීම් සිදු කර ඇති නිසා සභාවේ සමුච්චිත අරමුදල එම මුදලින් අඩුවෙන් පෙන්වා තිබුණි. | යන්ත්‍රය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොතිබූ අතර, එය පශු සම්පත් සංවර්ධන අධිකාරියට පැවරීමට අනුමැතිය ඉල්ලා ලිපියක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යවා තිබුණි. | මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හෝ වෙනත් ආයතනයකට පැවරීමට කටයුතු කළ යුතුය. |

**3.8 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ------------- |
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් 4.2.1 (අ) හා (ආ) වගන්ති අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව රු.3,301,700 ක වටිනාකමකින් යුත් වී ඇසුරුම් මලු, රු.448,400 ක වටිනාකමකින් යුත් පළතුරු පැල සහ රු.735,000 ක පොහොර සෘජුව මිලදී ගැනීම සඳහා වාලච්චේනයි ගොවිජන සේවා කාරක සභාව විසින් ලංසු කැඳවා තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොක්කාඩිච්චෝලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමකින් තොරව රු.1,515,450 ක් වටිනා බිත්තර වී, රු.1,930,000 ක් වටිනා යූරියා පොහොර සහ රු.3,330,750 ක් වටිනා කෘෂිකාර්මික උපකරණ මිලදී ගෙන තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.9 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| කලුවන්චිකුඩි ගොවිජන සේවා කාරක සභා පරිපාලන බල ප්‍රදේශයේ වැව්වල සවි කිරීම සඳහා වැව් මට්ටමේ සම්ප්‍රේෂක 15ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය මගින් ලබා දී තිබුණි. ඉන් වැව් මට්ටමේ සම්ප්‍රේෂණ යන්ත්‍ර 04ක් සවිකර නොතිබුණු අතර, ඒ හේතුවෙන් ආපදා කාලවලදී එම වැව්වල මිනුම් වාර්තා කිරීමට නොහැකි වී පැවතුණි. | ලැබුණු අනුපිළිවෙලට එය ස්ථාපනය කිරීමට කටයුතු කරනු ලබන ලැබේ. | ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.10 මානව සම්පත් කළ මනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් 2022 දෙසැම්බර් 31 දින වන විට සභාවේ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් මානව සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම පිළිබඳ තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය. | අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් කාර්යාලයට යවා ඇති අතර, ඉදිරියේදී එය විගණනයට ලබා දෙනු ලැබේ. | කාර්ය මණ්ඩල තොරතුරු විගණනයට ලබා දීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| අයවැය තොරතුරු, සැබෑ මුදල සැසඳීම සහ සටහන් යටතේ හෙළිදරව් කිරීම අරයියම්පති ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර නොතිබුණි. | සටහන් යටතේ තිබූ හෙළිදරව් කිරීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

**4.2 තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක කෘ.සේ.පොදු /2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 17 විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5.** ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| | ----------------------- | -------------------- | ------------- |
| (අ) | 2012 පෙබරවාරි 29 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 4/2012 (F.B) සහ අංක 08/2019 හි 3.4.6 වගන්තියට අනුව, 2010 සිට 2020 දක්වා කාලය තුළ මහ සහ යල කන්න සඳහා; කොක්කාඩිච්චෝලෙයි ගොවිජන සේවා කාරක සභාවේ ගොවීන් 46 දෙනෙකු සඳහා ලබා දුන් ණය මුදලේ ශේෂය රු.2,367,200 ක්ව පැවතුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල නැවත අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත වේලාවට ණය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 04/2012 දරන ගොවි බැංකු චක්‍රලේඛයේ 3.2 (viii) වගන්තියට අනුව ගොවීන්ට ලබා දෙන ණය මුදලින් සියයට 10ක් කණ්ඩායම් සේවා ගිණුමේ රඳවා ගත යුතුය. කෙසේ වෙතත්, වන්තරමූලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් මෙම සියයට 10 සේවා මුදල් රඳවා ගැනීමේ අවශ්‍යතාවය නොසලකා යල කන්නය සඳහා ගොවීන් 36 දෙනෙකු වෙත රු.1,080,000 ක (එක් අයෙකුට රු.30,000 බැගින්) ණය හා මහ කන්නය සඳහා ගොවීන් 125 දෙනෙකුට රු.3,750,000 ක ණය ලබා දී තිබුණි. | ඉදිරියේදී ණය ලබා දීමේදී මෙම මාර්ගෝපදේශ අනුව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ අනුව ණය ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2012 පෙබරවාරි 29 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 4/2012 (F.B) හි 3.4.6 වගන්තියට අනුව වන්තරුමූලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් 2019/2020 මහ කන්නයේ සිට 2021/2022 යල කන්නය දක්වා කාලය සඳහා ගොවීන් 17 දෙනෙකුට ණය ලබා දී තිබූ අතර, ණය ශේෂය රු.429,500 ක් හා පොලිය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව මෙම ගොවීන්ට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි. | එය සමථ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | අංක 4/2012 දරන චක්‍රලේඛයට අනුව ණය හා එහි පොලිය අය කර ගත යුතුය. |

## 6. පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| ----------------------- | -------------------- | ------------------------ |
| අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව සියලුම රජයේ නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයෙන් තම පැමිණීම සහ පිටවීම තහවුරු කළ යුතුය. කෙසේ වෙතත්, ගොවිජන සේවා කාරක සභා 17 හි රු.16,500ක මුදලක් වැය කර ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කළද, එම ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා සභාවේ කාර්ය මණ්ඩලය පැමිණීම සහ පිටවීම තහවුරු කර නොතිබුණි. | නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා පැමිණීම සහ පිටවීම තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |